ආදරණීය දුවේ පුතේ,

**<u>Covid 19 නිවාඩුවේ "රටක් වටින පොතක්" ලිවීමේ වැඩසටහන.</u>**

දයාබර දරුවන් පසුගිය මාර්තු 16 දින සිටම නිවසට වී ඔබගේ අධ්‍යයන කටයුතු වල නියැලෙමින් කාලය ගත කරන බව අපි දනිමු. නිවසේ සිටම අධ්‍යාපනය ලබා ගැනීමට ඔබ දරන උත්සාහය ඉතා ඉහළින් අගය කරමු. මේ නිවාඩුව තවත් අර්ථවත් කිරීමට "රටක් වටින පොතක්" වැඩසටහන ඔබට දායාද කොට ඇත. දැන් ඔබට මේ නිවාඩු කාලයේ නිවසේ සිටම පොතක් ලියන්නට කටයුතු කළ හැකිය. ඔබේ නිර්මාණශීලී හැකියාවන් ඔප් නංවමින් ඔබ පුංචි කතුවරයෙක් බවට පත් කිරීමට මෙම වැඩසටහන සංවිධානය කර ඇත. දූ පුතුන්ගේ තෝරාගත් නිර්මාණ 10,000 අතරින් හොඳම නිර්මාණ 100ක් සඳහා විශිෂ්ට සම්මාන ලබාදීමටත්, එම පොත් 100 මුද්‍රණය කිරීමටත් සැලසුම් කර ඇත. ඉතිරි නිර්මාණ 9,900 ඉලෙක්ට්‍රොනික මාධ්‍යයෙන් පොතක් වශයෙන් ප්‍රසිද්ධ කිරීමටත් අධ්‍යාපන අමාත්‍යාංශය බලාපොරොත්තු වේ.

**මොනවාද අපි ලියන්නේ.....:**

ඉතින් දුවේ පුතේ, දැන් අපි ලිවීම ආරම්භ කරමු. මොනවද අපි ලියන්නේ? අපට ලියන්න පුළුවන් ක්ෂේත්‍ර ගණනාවක් ඔබේ පාසලට දන්වා තිබෙනවා. සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂා ත්‍රිත්වයෙන්ම මේ පොත් ඉදිරිපත් කරන්නට පුළුවන්. 1 හා 2 ශ්‍රේණිවල දරුවන්ට චිත්‍ර/කවි/ළමා කතා/චිත්‍ර කතා/කාටූන් ඇතුලත් නිර්මාණ සංග්‍රහයක් මේ තරගය සඳහා ඉදිරිපත් කරන්න පුළුවන්. ඒ වගේම 3 ශ්‍රේණියේ සිට 13 ශ්‍රේණිය දක්වා ඉගෙනුම ලබන දුවලා පුතාලට තමන් කැමති ඕනෑම සාහිත්‍ය නිර්මාණයක් ඉදිරිපත් කරන්න පුළුවන්. ඒ සඳහා පහත ක්ෂේත්‍රවලින් එකක් තෝරාගත හැකියි.

**පොත් වර්ග (ශානර):**

ළමා කතන්දර, පද්‍ය රචනා, යොවුන් සාහිත්‍ය කෘති, කෙටිකතා, නවකතා, නාට්‍ය රචනා, පරිවර්තන, ඓතිහාසික කතා, මායා කතා, මිථ්‍යා කතා, අභිරහස් කතා, උපමා කතා, ජන කතා, විද්‍යා ප්‍රබන්ධ, පරිසර විත්ති, චරිතාපදාන, ස්වයං චරිතාපදාන, සුරංගනා කතා, අතිශයෝක්ති කතා, ආගමික කතා, වීර කතා, විෂයානුබද්ධ පොත්, පුරාවෘත්ත, මිශ්‍ර පොත් යන ඕනෑම කාණ්ඩයකින් එකක්, තෝරා ගන්න.

**කොහොමද දැන් ලියන්නෙ.....?**

• ඉස්සරවෙලාම ඔබ ලියන කාරණය ගැන හොඳට කල්පනා කරන්න.

• ඊට පස්සේ පුංචි සැකිල්ලක් නිර්මාණය කරගන්න. (මොනවද පොතට ඇතුලත් කරන්නේ කියලා)

• ඊළඟ අදියර තමයි, මේ සැකිල්ල තමන්ට උවමනා විදිහට සකස් කරල, සංවිධානය කරලා, කොටස්වලට බෙදලා, පොතේ මූලික සැකිල්ල හදාගන්න එක. (දැන් අපිට ලියන්න උවමනා දේ සූදානම් කරලා අවසානයි.)

• ඊළඟ අදියර තමයි, මේ කොටස් එකිනෙක සම්පූර්ණ කරන එක.

• සෑම නිර්මාණයකම ඉතා සිත්ගන්නා ගලායාමක් තිබිය යුතුයි. ඔබ විෂය කරුණු පිළිබඳව/ නවකතාවක්/ කෙටිකතාවක්/ පුරාවෘත්තයක් ලියුවත් ඒ සටහන තුළ කුතුහලය, කියවීමට ආශාව ඇතිවීම, කියවන අයගේ බුද්ධිය අවදි කිරීම වැනි කරුණු අඩංගු වී තිබිය යුතු අතර එය, ළමා මනසට ගෝචර විය යුතුයි.

• ඔබගේ අත් පිටපත කිහිප වරක් කියවන්න. එහි අඩුපාඩු ඇත්නම් ඒවා සකස් කර, 2020.06.30 දිනට පෙර ඔබේ පන්ති භාර ගුරුභවතා වෙත භාර දෙන්න.

• පාසලෙන් ලැබෙන උපදෙස් අනුව පිට කවරය, දෙවන පිටුව, පිදුම, ස්තූතිය, පෙරවදන, පටුන සහ ඔබගේ පෞද්ගලික තොරතුරු සමඟ ඡායාරූපයක් ඇතුළත් කර අවසාන පිටුව සකස් කරන්න.

• ඔබ අත් අකුරින් ලියූ දේ පරිගණකයකින් යතුරුලියනය කර ගන්නවා නම් වඩාත් සුදුසු යි. එහි අකුරු වර්ගය Iskoola Pota වෙන්න ඕනා.

• ඔබ ලියා ඇත්තේ සාර්ථක පොතක් නම්, එයට සම්මානයක් හිමි වෙනවා නොඅනුමානයි. ඉතින්, ඔබ අදම ලිවීම ආරම්භ කරන්න. එය රටක් වටින පොතක් වේවි. පාසලේ ඉන්න සෑම දුවෙක් පුතෙක් ම මේ කාර්යයට එකතු වේවි කියලා අප බලාපොරොත්තු වෙනවා. සාර්ථකව ලියන පොත් සඳහා සම්මාන ලබාදීමට ඔබගේ පොත් ලැබෙන තුරු අධ්‍යාපන අමාත්‍යාංශය මඟ බලා ඉන්නවා.

වැඩි විස්තර සඳහා :- Http://www.natlib.lk හෝ http://www.mov.gov.lk වෙබ් අඩවි,

පන්ති භාර ගුරුභවතාගේ දුරකතන අංකය :- ................................................................

විදුහල්පතිගේ දුරකතන අංකය :- ................................................................

කලාප සම්බන්ධීකරණ නිලධාරීගේ දුරකතන අංකය :- ......................................................

විදුහල්පතිගේ අත්සන හා නිල මුද්‍රාව :- ...............................................